# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1826/1 - 2013 සැප්තැම්බර් මස 02 වැනි සඳුදා - 2013.09.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පඩිපාලක සභා ආඥාපනත

නිවේදනයයි

පොල් වැවීමේ කාර්මාන්තය

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණය පිළිබඳව දැක්වෙන විරෝධතාවයන් 2013 සැප්තැම්බර් මස 24 වැනි දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද ඊට අඩංගු විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2013 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් අති කරන ලදුව, 1949 අප්‍රේල් මස 30 වැනි දින අංක 9971 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, වරින් වර වෙනස් කරන ලද්දාවූ ද, අවසන්වරට අංක 1747/5 සහ 2012.02.28 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් වෙනස් කරනු ලැබුවාවූ ද, තීරණ පහත සඳහන් අයුරින් තවදුරටත් වෙනස් කළ යුතු ය.


1A - G 18190— 180 (2013/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*සැ. යු.- අති විශෙෂ ගැසට් අංක 1825/01 කාණ්ඩය අංක 1825/40න් අවසන් වේ.*

(1) එම උපලේඛනයේ II වැනි කොටසේ කෑලි මිම්මේ සේවකයින්ට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණයන් මෙසේ ය.

| කාර්යය | පඩි ප්‍රමාණය<br>රු. ශ. |
|---|---|
| (1) වැවිල්ල දැමීම හා නඩත්තු කිරීම, පොල් කැඩීම - ගස් 1000ක් සඳහා | 1,655.00 |
| (2) කොප්පරා තැනීම, පොල් ලෙලි ගැසීම, පොල් බිඳීම, කොප්පරා වේලීම සහ තේරීම - ගෙඩි 1000ක් සඳහා | 485.00 |

*III කොටස*

(2) කාර්යයන්

(අ) පොල් වැවිල්ලක් වගා කිරීම හා පවත්වාගෙන යෑම
(ආ) කොප්පරා සෑදීම

ඉහත සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් කාල මිම්මේ අවම වැටුප් ප්‍රමාණයන් වන්නේ

සියලු කම්කරුවන් සඳහා දිනකට - රු. 415.00

ගව පාලනයේ නිරත යම් සේවයෙකුට වැඩ වේලා සඳහා ඉරිදාට ගෙවිය යුතු පඩි ප්‍රමාණය විය යුත්තේ, මෙම කොටසේ කලින් දී ඇති විධිවිධානවලට ඇතුළත් කිසියම් ප්‍රතිවිරෝධී කරුණකින් ප්‍රතිශෝධනය නොවූ වැඩ කරන සාමාන්‍ය දවසකට එබඳු සේවකයෙකුට ගෙවිය යුතු පඩි ප්‍රමාණය මෙන් එකහමාර ගුණයකි.

*III 'ඒ' කොටස*

(අ) කොන්දොස්තර කෙනෙකුගේ වැඩවලට
(ආ) මුරකරුවෙකුගේ වැඩවලට

අදාළ කාල මිම්මේ අවම වැටුප් ප්‍රමාණය වන්නේ :

| අක්කර ප්‍රමාණය | | මුරකරු<br>රු. ශ. | කොන්දොස්තර<br>රු. ශ. |
|---|---|---|---|
| (1) අක්කර 10ට නොඅඩු එහෙත් අක්කර 25ට අඩු පොල් වැවිල්ලක් හෝ කොටසක නම් | - | 9,520.00 | අදාළ නැත |
| (2) අක්කර 25ට නොඅඩු එහෙත් අක්කර 50කට අඩු පොල් වැවිල්ලක් හෝ කොටසක නම් | - | 9,935.00 | 10,210.00 |
| (3) අක්කර 50ට වැඩි පොල් වැවිල්ලක් හෝ කොටසක් නම් | - | 11,385.00 | 11,660.00 |

09-356/1

---

## පඩිපාලක සභා ආඥාපනත

## නිවේදනයයි

**මල්, විසිතුරු පැල, එළවළු සහ පළතුරු වගා කිරීමේ සහ අපනයනය කිරීමේ කාර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් ගැනීමට මල්, විසිතුරු පැල, එළවළු සහ පළතුරු වගා කිරීමේ සහ අපනයනය කිරීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතාවයන් 2013 සැප්තැම්බර් මස 24 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවක්ම, එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
මල්, විසිතුරු පැල, එළවළු සහ පළතුරු වගා කිරීමේ
සහ අපනයනය කිරීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2013 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

මල්, විසිතුරු පැල, එළවළු සහ පළතුරු වගා කිරීමේ සහ අපනයනය කිරීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව 2012 මාර්තු මස 09 වැනි දින 1748/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති පහත I කොටසේ සඳහන් සේවා බාණ්ඩ සඳහා ගෙවිය යුතු අවම වැටුප් පිළිබඳ II කොටසේ සඳහන් පරිදි තීරණ ගැනීමට එකී පඩි පාලක සභාව අදහස් කරනු ලැබේ.

*I කොටස*

**පුහුණු**

පටක හා බීජ රෝපනයේ නියැලෙන්නන්, බද්ධ කිරීමේ කටයුතුවල නියැලෙන්නන්, අපනයනය හා විකිණීම පිණිස මල්පැල, මල් හා මල් අතු සකසන්නන්, විසිතුරු පැල, අතු හෝ රිකිලි සකසන්නන්, තත්ත්ව පරීක්ෂාවේ යෙදෙන්නන්, දිලීර නාශක, කෘමිනාශක හා පොහොර යොදන්නන්, ඇසිරීමේ කාර්යයන්හි නියුක්ත සේවකයන්, ගබඩාකරුවන්, සේවක පරිපාලනයේ යෙදෙන්නන්, පුහුණුවක් අවශ්‍ය කාර්යයන්හි නියැලෙන්නන්,

**අර්ධ පුහුණු**

තවාන් දැමීම, පැල සිටුවීම හා වගාව නඩත්තු කරන සේවකයන්, එළදාව නෙලන්නන් සහ එකතු කරන්නන්, ගබඩා සහයකයින්, අර්ධ පුහුණු වෙනත් සේවකයන්

**නුපුහුණු**

වගාව පිණිස භූමිය සකස් කරන සේවකයන්, පැටවීමේ බෑමේ නියුක්ත කම්කරුවන්, පුහුණුවක් අවශ්‍ය නොවන වෙනත් සේවයන්හි නියැලෙන්නන්

*II කොටස*

*ගෙවිය යුතු අවම වේතනය*

| | දෛනික<br>*රු. ශ.* | මාසික<br>*රු. ශ.* |
|---|---|---|
| පුහුණු | 565.00 | 14,125.00 |
| අර්ධ පුහුණු | 515.00 | 12,875.00 |
| නුපුහුණු | 465.00 | 11,625.00 |

09-356/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.